**ශීර්ෂය 124 - සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කල විගණන මතය**

සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 01 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපවන බව ප්‍රකාශ කළ නොහැක. තවද, ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක් ප්‍රාග්ධන වැය විෂයයකට සහ පුනරාවර්තන වැය විෂයයන් 10 කට අයත් එකතු වටිනාකම රු.15,424,225 ක් වූ බැරකම් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි | වර්ෂයට අදාළ බැරකම් ගිණුම් ගත කළ යුතු වීම. | විගණන අවස්ථාවේදී 2018 වර්ෂය සඳහා බැරකම් සටහන් කිරීම සඳහා ලේඛණයක් නඩත්තු කර නොතිබූ අතර මෙම වර්ෂයේ සිට බැරකම් ලේඛණයක් නඩත්තු කිරීමට කටයුතු කරන බව. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් | 2016 වර්ෂයේදී අනතුරට පත්ව තිබුණු වාහනයක් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.10,713,494 ක් වැයකර තිබූ අතර, රක්ෂණ වන්දි ලෙස 2018 වර්ෂයේදී | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | 2016 වර්ෂයේදී අනතුරට පත්වූ අංක CAH – 0485 දරන වාහනය අළුත්වැඩියා කිරීමේදී සිදු |

| | | | |
|---|---|---|---|
| රෙගුලාසි සංග්‍රහය මු.රෙ.104,105 සහ 110 | රු.8,557,877 ක් ලැබී තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 105 ප්‍රකාරව ප්‍රාරම්භක හා අවසාන පරීක්ෂණ සිදුකර වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. මේ හේතුවෙන් දරන ලද රු.2,155,617 ක් වූ වියදම අමාත්‍යාංශයට පාඩුවක්වී තිබුණි. පාඩු හා හානි ලේඛණයට මෙම අනතුර සම්බන්ධ විස්තර ඇතුළත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පාඩු හා හානි යටතේ මෙම පාඩුව වාර්තා කර නොතිබුණි. | | වූ හානිය විසර්ජන ගිණුමේ හානි හා පාඩු අත්තිකාරම් පිළිබඳ ප්‍රකාශයෙහි සටහන් කර නොතිබූ අතර ඉදිරියේදී අවසන් ගිණුම් සකස් කිරීමේදී හානි හා පාඩු අත්තිකාරම් පිළිබඳ ප්‍රකාශයෙහි සටහන් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. |

## 2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පිළිමතලාව ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ආදර්ශ ගම්මාන 02 ක් හඳුනා ගෙන ප්‍රජාවන්ගේ ගැටළු හඳුනා ගැනීම සහ අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වූ පර්යේෂණයකට රු.250,000 ක් වෙන්කර තිබුණු නමුත් එම පර්යේෂණය ක්‍රියාත්මක කර නොතිබුණි. | සැළසුම්ගත කාර්යයන් නිසි පරිදි ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ ආරම්භයේ සාකච්ඡාවට භාජනය වූ සැලසුම් රජයේ වෙනස්වීම් මත වෙනස් වීම් වලට භාජනය විය. අවසානයේදී 2018.09.03 දිනැති ලිපිය මගින් අනුමත කරන ලද්දේ පෙර වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ පර්යේෂණ ගම්මාන 02 පමණක් බව සඳහන් කරමි. එබැවින් මෙහි සඳහන් ආදර්ශ ගම්මාන දෙක පිළිබඳ යෝජනාව ක්‍රියාත්මක නොවුණි. |

**2.2** **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාජ ගැටළු පිළිබඳ පර්යේෂණ සඳහා වූ ව්‍යාපෘතිය වර්ෂයක් තුල අවසන් කිරීම සඳහා රු.5,000,000 ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී රු.2,183,000 ක් වියදම් කර ව්‍යාපෘති යෝජනාවලිය සකස් කිරීම පමණක් සිදුකර තිබුණි. | වර්ෂය තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති නියමිත කාලය තුල අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | මේ යටතේ වෙන් කරන ලද මුදල රු.මිලියන 5 කි. මෙම ප්‍රතිපාදන යටතේ ක්ෂේත්‍රයේ ප්‍රවීණ උපදේශකවරයෙකුගේ මඟපෙන්වීම යටතේ මෙම පර්යේෂණ අදාළ වන ආයතනවල නිලධාරීන් මඟින්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බව තීරණය වූ බැවින් අදාළ නිලධාරීන්ට පර්යේෂණය ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරන ලදී. 2018 මැයි අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම හේතුවෙන් පර්යේෂණ 03 ක් පමණක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. |
| (ආ) | ග්‍රාම සංවර්ධන කටයුතු දියුණු කිරීමේ අරමුණින් බොරැල්ල සහ පිළිමතලාව අභ්‍යාස ආයතන විසින් "තරණය" පුවත් හසුන අර්ධ වාර්ෂිකව පිටපත් 1,000 බැගින් නිකුත් කිරීමට සැළසුම් කර තිබුණි. ඒ අනුව පළමු කලාපය සඳහා රු.50,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද එය මුද්‍රණය කර තිබුණේ මාස 06 ක් ප්‍රමාදවී අවසන් කාර්තුවේදී බැවින් දෙවන කලාපය මුද්‍රණය කර නොතිබුණි. | වාර්ෂිකව සකස් කරන සැළසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුත වීම. | 2018 වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද වාර්ෂික සැලැස්ම අප්‍රේල් මසදී අනුමත වූ අතර, නැවත අගෝස්තු හා සැප්තැම්බර් මාසවලදී සංශෝධනය කිරීමට සිදු වූ හෙයින්ද, ආයතනයට අදාල සංවර්ධන කටයුතු නියමිත පරිදි සිදු කිරීම ප්‍රමාද වූ හෙයින්ද, අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීමට නියමිත " තරණය" පුවත් හසුනේ එක් කලාපයක් පමණක් අවසාන කාර්තුවේදී මුද්‍රණය කර බෙදා හැර ඇතිබව දක්වා තිබුණි. |

**2.3 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | ------------------------------- |
| (අ) | අමාත්‍යාංශය සතු වාහන 12 ක් ධාවන තත්ත්වයේ නොතිබූ අතර එම වාහනවලින් පිරිවැය රු.16,600,000 ක් වූ වාහන 04 ක් සහ පොත්වල ඇතුළත් නොවූ වාහනයක් වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාලයක සිට නිශ්ක්‍රීයව, ආයතන පරිශ්‍රයේ පැවතිණි. ඉතිරි වාහන 07 ද වර්ෂයක පමණ කාලයක සිට ධාවනය කර නොතිබුණි. තවද බොරැල්ල ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා අභ්‍යාස ආයතනයට අයත් වාහන 02 ක් ද මාස 05 ක කාලයක සිට ආයතනයේ පරිශ්‍රයේ නිශ්ක්‍රීයව පැවතිණි. | වාහන අළුත්වැඩියාවන් නියමිත කාලය තුළ සිදු කළ යුතු වීම හෝ එසේ කළ නොහැකි වාහන විධිමත්ව අපහරණය කිරීම. | වාහන අළුත්වැඩියාව සඳහා කටයුතු කරගෙන යනු ලැබේ. |
| (ආ) | බොරැල්ල ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාරයට සහ භෝජනාගාරයට 2017 සහ 2018 වර්ෂවලදී රු.3,385,762 ක් වූ උපකරණ මිලදී ගෙන තිබුණි. 2019 ජුනි 07 දින දක්වාම එම උපකරණ නිශ්කාර්යව පැවතීම හේතුවෙන් විදුලි උපකරණවල වගකීම් කාලය උපකරණ පාවිච්චි නොකරම කල් ඉකුත්වී තිබුණි. | අවශ්‍යතාවයන් අනුව මිලදී ගැනීමත් නිසි වේලාවට බෙදා හැරීමත් සිදුකළ යුතු වීම . | නේවාසිකාගාරය අළුත්වැඩියා කටයුතු ප්‍රමාද තත්ත්වයේ පවතින බැවින් මිලදීගත් උපකරණ ගබඩාවේම රඳවා ගැනීමට සිදුවූ බව. |
| (ඇ) | මෙම නේවාසිකාගාරයේ නිලධාරීන් 30 දෙනෙකුට නේවාසිකව පුහුණුවීම් ලබාදීමට ඉඩ පැවතියද අළුත්වැඩියාවන් සිදුනොවීම නිසා නේවාසිකව සිටීමට නොහැකි තත්ත්වයක පැවතිණි. තවද අළුත්වැඩියා කටයුතු සඳහා රු.6,789,461 ක් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී ලබාදී තිබුණද එම අළුත්වැඩියා කටයුතු 2019 ජුනි 7 දින වනවිටත් ආරම්භ කර | අළුත්වැඩියා කටයුතු නියමිත කාලය තුළ සිදුකර ගත යුතු වීම. | නේවාසිගාරයේ අළුත්වැඩියාවන් ප්‍රමාද තත්ත්වයක පවතී. |

නොතිබුණි.

## 2.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000 බැගින් වූ මාසික දීමනාව ලබාදීම සඳයා වැඩිහිටියන් 416,667 දෙනෙකුට රු.මිලියන 9,816.50 ක් වෙන්කර තිබුණි. එසේවුවද, රු.මිලියන 9,590.0 ක් වැඩිහිටියන් 410,397 දෙනෙකු වෙත දීමනා ලබාදී තිබූ නමුත් අනුමැතිය ලබාදී තිබූ වැඩිහිටියන් සම්පූර්ණ ප්‍රමාණයටම වැඩිහිටි දීමනාව ලබාදී නොතිබුණි. | සුදුසුකම් සපුරන වැඩිහිටියන් උපරිමයක් වෙත දීමනා ලබාදීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ ලද ප්‍රතිපාදන මත ලබාදිය හැකි ප්රතිලාභී සංඛ්‍යාව වූයේ 416,667 ක් විය. ඒ අනුව එම මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙතම ප්‍රතිපාදන නිදහස් කරන ලද නමුත්,<br>• ප්‍රතිලාභීන් මියයාම<br>• පදිංචිය මාරු කිරීම හේතුවෙන් දීමනාව ගැනීම මඟ හැරීම<br>• අසනීප හෝ වෙනයම් හේතුවක් මත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකිවී තිබුණි. මෙම කරුණු පිළිබඳව නිශ්චිතවම හඳුනා නොගෙන පොරොත්තු ලේඛණයෙන් පුද්ගලයන් ඉවත් කිරීම කළ නොහැකි වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික්ක 11 ක වකුගඩු රෝගීන් 21,500 ක් වෙනුවෙන් මාසිකව රු.5,000 බැගින් ලබාදීමට රු.මිලියන 1,322.9 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේවුවද අනුමත වූ ප්‍රමාණයට වඩා රෝගීන් 1,838 ක් ද ඇතුළත්ව රෝගීන් 23,338 ක මුදල් ලබාදී තිබුණද, වර්ෂය අවසානයට රු.මිලියන 5.064 ක් ඉතිරිව පැවතිණි. එසේම වකුගඩු රෝගීන් පිළිබඳ පොරොත්තුගත ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රතිපාදන උපරිම උපයෝජනය තුළින් රෝගීන්ට සහන සැළසීමට කටයුතු කල යුතු වීම. | වකුගඩු රෝගීන්ගේ මිය යාම් හා නව ඇතුළත් වීම් ඉතා සීඝ්‍රයෙන් සිදුවන බැවින් මෙවැනි සුළු ඉතිරිවීම් වළක්වාලීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. කෙසේ වෙතත් මේ ගැටළුව අවම කිරීමට හැකි උපරිමයෙන් කටයුතු කර වකුගඩු රෝගීන් වැඩි පිරිසක් සඳහා සහන සැලසීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 ක ආබාධිත පුද්ගලයන් 34,667 කට මාසිකව රු.3,000 බැගින් ආබාධිත දීමනා ලබාදිමට රු.මිලියන 1,151.76 ක් ප්‍රතිපාදනය කර තිබුණි. ආබාධිත පුද්ගලයන් 31,956 දෙනෙකුට දීමනා ලබා දී තිබුණු අතර රු.මිලියන 10.5 ක් ඉතිරිව පැවතිණි. එසේම පොරොත්තු ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රතිපාදන උපරිම උපයෝජනය තුළින් අබාධිතයන්ට සහන සැළසීමට කටයුතු කල යුතු වීම. | විගණනය මඟින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වන අතර, මෙම කාර්යාලය මඟින් මාස තුනෙන් තුනට (කාර්තු වශයෙන්) ආධාරලාභීන් වෙනුවෙන් අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දෙනු ලැබේ. |
| (ඇ) | අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් අළුත්වැඩියාව සඳහා යොමුකරන ලද ආයතනවල වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා කාලයක් තුළ රඳවා තබා තිබූ නමුත් අළුත්වැඩියා කර නොතිබුණි. | වාහන සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු වීම. | අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සියල්ලෙහිම භාවිතයෙන් ඉවත් කරන ලද වාහන හඳුනාගැනීම හා අපහරණය කිරීමේ කටයුතු 2019 අගෝස්තු මස ඇතුළතදී සිදු කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

## 3. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| බොරැල්ල ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ තනතුර 2018 අගෝස්තු මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි. තවද එම ආයතනයේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් ද දීර්ඝ කාලීනව පුරප්පාඩු පැවති අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට බැහැරව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සේවයේ යොදවා තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ කාර්යභාරය ඉටුකර ගැනීම ගැටළුකාරී තත්ත්වයක පැවතුණි. | ආයතනයේ කාර්ය භාරයන් පවත්වා ගෙන යාම සඳහා ස්ථිර අධ්‍යක්ෂවරයකු පත්කළ යුතු වීම. | අධ්‍යක්ෂ තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ හිඟතාවය හේතුවෙන් මෙම තනතුර පිරවීමට නොහැකි වී තිබුණි. |